NCP/CS/ED/11/3-1

2023.11.07

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 2023/05

සියළුම ලේකම්වරු , නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු මැද පළාත.

**උතුරු මැද පළාත් සභාවේ පුනරාවර්තන වියදම් දැරීම පිළිබඳ මාර්ගෝපදේශ.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති අංක NCP/CS/ED/01/11 සහ 2014.03.25 දිනැති ආයතන චක්‍රලේඛක 2014/01 සහ ඊට අදාළව නිකුත් කර ඇති සංශෝධන වලට අමතර වශයෙනි.

02. 2023 වර්ෂයේ මෙතෙක් අවසන් නොවූ අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු නියමිත පරිදි අවසන් කිරීම සඳහා ඉහත චක්‍රලේඛනය මගින් මා විසින් නිකුත් කර ඇති සීමාවන් 2023 නොවැම්බර් , දෙසැම්බර් හා 2024 ජනවාරි දක්වා වූ මාස 03 සඳහා පමණක් පහත දැක්වෙන පරිදි ලිහිල් කිරීමට තීරණය කර ඇත.

i. සතියේ දිනවල පැය 02 සීමාව ඉක්මවා අතිකාල සේවයේ යෙදවීම. (උපරිම පැය 03 )
ii. සති අන්ත හා රජයේ නිවාඩු දිනවල පැය 09 සීමාව ඉක්මවා අතිකාල සේවයේ යෙදවීම. (උපරිම පැය 12)
iii. පූර්ණ කාලීනව කාර්යාල රාජකාරී වල යොදවා ඇති සංවර්ධන නිලධාරීන්ට පැය 40 සීමාව ඉක්මවා ඉහත i සහ ii හි සඳහන් සීමාවන්ට යටත්ව අතිකාල සේවයේ යොදවා ගැනීම.
iv. මාණ්ඩලික නිලධාරීන් සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත මසකට උපරිම දින 05 ක් දක්වා නිවාඩු දින සේවයේ යොදවා ගැනීම.
v. අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු පවතීනම් පමණක් ඉරිදා දින හැර අනෙකුත් රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින වල කාර්යාල විවෘත කිරීම.

03. මෙම සීමාවන් යටතේ නිලධාරීන් හා සේවකයින් සේවයේ යොදවා ගැනීමේදී සත්‍ය වශයෙන්ම අවසන් කිරීමට රාජකාරී කටයුතු පවතින බව අමාත්‍යාංශ ලේකම්වරුන් සෑහීමකට පත්වීමෙන් අනතුරුව පමණක් මොවුන් සේවයේ යොදවා ගත යුතු අතර එසේ සේවයේ යොදවා ගන්නා නිලධාරීන් අදාළ කාලසීමාව තුළ සක්‍රීයව රාජකාරී වල යෙදී ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් ඒ සඳහා ගෙවීම් කටයුතු සිදු කළ යුතුය. එසේම සීමා ලිහිල් කිරීම හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම් සඳහා අමතර ප්‍රතිපාදන ලබා දීම සිදු නොකරන අතර 2023 වර්ෂයට වෙන් වී ඇති ප්‍රතිපාදන සීමාව තුළ අතිකාල සේවයේ යොදවා ගැනීමට සියලුම ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. එමෙන්ම 2023 වසර තුළ ඉටුකළ යුතුව තිබූ කටයුත්තක් 2024 වසරට ගෙන නොයන බවට අතිකාල නිර්දේශ කරන නිලධාරියා වග බලා ගත යුතුය.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.